# කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

## ජාත්‍යන්තර තත්ත්ව සහතික සඳහා රජයෙන් සහන
## ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් දේශීය කර්මාන්තවල ඵලදායිතාවය ඉහල නැංවීම, බලශක්ති කාර්යක්ෂමතාව හා ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා විශේෂ අනුග්‍රහයක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. මේ සඳහා 2019 ජනවාරි 01 දිනට වාර්ෂික පිරිවැටුම රු. මිලියන 750 ට අඩු සහ සේවක සංඛ්‍යාව 300 ට අඩු පහත සඳහන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට ඉහත ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබා ගැනීමට අයදුම් කළ හැකිය.

- ආහාර නිෂ්පාදන
- තේ ආශ්‍රිත නිෂ්පාදන
- පොල් ආශ්‍රිත නිෂ්පාදන
- කුළුබඩු නිෂ්පාදන
- ඇසුරුම්කරණ

**ප්‍රතිලාභ:**

- තෝරාගත් කර්මාන්ත සඳහා උපරිමය රු. 200,000/- දක්වා සහතිකපත් ගාස්තු ගෙවීම් කරන අතර සහතිකපත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාල ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- රජයට අනුබද්ධ පිලිගත් ආයතනයකින් උපදේශන සේවා ලබාගන්නේ නම් උපදේශන සේවා ගාස්තු උපරිමය රු. 100,000/- දක්වා ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවීම් කරනු ලැබේ.
- සහතිකපත් ක්‍රියාවලිය සිදුවන කාලය තුල විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් කර්මාන්ත කරුවන්ට සහාය වීම කරනු ලැබේ.

**යෝග්‍යතාවය:**

- අවම වශයෙන් අවු. 03 ක් නිෂ්පාදන වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක විය යුතුය.
- අයදුම්පත් යොමු කරන අවස්ථාව වන විට අදාල සහතික ලබාගැනීම සඳහා සහතිකකරණ ආයතන වෙත අයදුම් නොකළ කර්මාන්තයක් විය යුතුය.
- ඉහත සඳහන් සහතිකකරණ වැඩසටහන යටතේ පෙර වර්ෂවල කිසිදු ප්‍රතිලාභයක් ලබා නොගත් කර්මාන්ත සඳහා තෝරාගැනීමේදී මූලිකත්වය දෙනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රියාවලිය:**

- පුවත්පත් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසි මත සහ සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කර ගන්නා කරුණු මත තෝරා ගැනීම සිදුකෙරේ.

**අනෙකුත් කොන්දේසි:**

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් (SLSI) හෝ ශ්‍රී ලංකා ප්‍රතීතකරණ මණ්ඩලයේ (SLAB) ප්‍රතීතකරණය ලද සහතිකකරණ ආයතනයකින් සහතිකපත් ලබා ගත යුතුය.
- සහතිකපත් සහ බිල්පත් 2019 දෙසැම්බර් 05 දිනට හෝ ඊට පෙර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර අදාල සහතිකපත් ගාස්තු සහ උපදේශන ගාස්තු ප්‍රතිපූරණය කරගත යුතුය.
- දේශිය කර්මාන්තයක් විය යුතු අතර අවම වශයෙන් දේශීය හවුල්කරු 60% ක ආයතනයේ හිමිකම් දැරිය යුතුය.
- අදාල කර්මාන්තය සහතිකකරණ ක්‍රියාවලිය සිදුවන කාලයතුල වෙනත් රජයේ ආයතනයකින් මෙයට සමාන ප්‍රතිලාභ ලබා නොගතයුතුය.
- තෝරා ගන්නා අයදුම්කරුවන් නියමිත දිනට ප්‍රථම තම ආයතනයේ සහතිකකරණ ක්‍රියාවලිය අවසන් කරන බවට අමාත්‍යාංශය සමග එකඟතා ගිවිසුමකට යටත් විය යුතුය.

**අයදුම්පත්:**

ඔබ විසින් සකසන ලද පහත සඳහන් තොරතුරු ඇතුලත් අයදුම්පත් අමාත්‍යාංශය වෙත 2019 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම **අධ්‍යක්ෂ, සංවර්ධන අංශ 1, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, 73/1, ගාලු පාර, කොළඹ 03.** යන ලිපිනයට යොමු කරන්න.

- කර්මාන්තය පිළිබඳ විස්තර
- නිෂ්පාදනවල ස්වභාවය
- වාර්ෂික නිපැයුම් ධාරිතාව
- අපනයනවල වටිනාකම
- වාර්ෂික පිරිවැය
- සේවක සංඛ්‍යාව
- ලබාගෙන ඇති ISO සහතිකකරණන් පිළිබඳ විස්තර

වැඩි විස්තර සඳහා දුරකතන අංක 0112422319, 0112432750 ඇමතීමෙන් හෝ www.industry.gov.lk මඟින් ලබාගත හැක. (Email: sector1mid@yahoo.com)

**ලේකම්**
**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන්**
**නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**
**73/1, ගාලු පාර, කොළඹ 03**